ඉරිදා ලංකාදීප
# වයඹ
2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා

කුරුණෑගල හා පුත්තලමේ මාස් කන්නයේ වී වගාව

# ඉලක්කයෙන් සියයට 39 යි

## ● කුරුණෑගල දිස්ත්‍රික්කයේ 39%

## ● පුත්තලම දිස්ත්‍රික්කයේ 37% යි

(අඹන්පොළ ශෂිකලා දර්ශනී)

**මෙවර 2021 මාස් කන්නයේ වයඹ පළාතේ කුඹුරු අක්කර 250118ක වී වගා කිරීම ඉලක්කය වුවත් මේ වන විට වගා කර ඇත්තේ ඒ ඉලක්කයෙන් සියයට 39ක් එනම් අක්කර 97436ක් පමණක් බැව් වාර්තා වෙයි.**

වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට මේ වන විට ලැබී ඇති වාර්තා සහ සංඛ්‍යා ලේඛන මෙම තොරතුරු අනාවරණය කරයි. මේ මස 15 වැනි දිනට පෙර මාස් කන්නය සඳහා වී වපුරා අවසන් වන ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගොවීන්ට උපදෙස් දී ඇත.

ඔක්තෝබර් මාසයේ වර්ෂාව ආරම්භ වීමත් සමග නොවැම්බර් මස 15 වැනි දින දක්වා කාල සීමාව වගා ස්ථාපිත කර අවසන් වීම මෙතෙක් කර ගෙන පැමිණි ක්‍රමවේදයයි. මේ වන විට මහා වාරි යටතේ වී වගා කරන ගොවීන්ට අවශ්‍ය ජලය වැව් සහ ජලාශවලින් නිකුත් කර ඇත. එහෙත් මේ වන විටත් වගා කර ඇත්තේ සියයට 39ක් බැව් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලින් අනාවරණය වෙයි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 206243ක වී වගා කිරීමට බලාපොරොත්තු වන අතර නමුත් මේ වන විට වී වගා කර ඇත්තේ අක්කර 80823ක් වැනි ප්‍රමාණයකි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 39කි. පුත්තලම දිස්ත්‍රික්කයේ අක්කර 43875ක වී වගා කිරීම ඉලක්කය වුවත් දැනට වගා කර තිබෙන්නේ අක්කර 16613කි. එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් සියයට 37කි.

### නොවැම්බර් 15 වැනිදා වෙද්දි සාධනීය තත්ත්වයක් අපේක්ෂා කරනවා

### වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ සිසිර කුමාර

**මෙවර මාස් කන්නයේ වී වගාව සම්බන්ධයෙන් පවතින ඉලක්ක සහ දැනට පවතින තත්ත්වය පිළිබඳව ඉරිදා ලංකාදීප වයඹ කළ විමසීමේ දී වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ පී. සිසිර කුමාර මහතා මෙසේ කීය.**

මෙවර මාස් කන්නය ආරම්භ කිරීමට අපේක්ෂා කළ වර්ෂාව නියමිත කාලයට නොලැබීම බාධකයක් වුණා. දැන් තමයි වර්ෂාව ආරම්භ වී තිබෙන්නේ. මේ වන විට මහා වාරිවල ජලය නිකුත් කිරීම ආරම්භ කර තිබෙනවා. ඒ අනුව මහා වාරි යටතේ ගොවීන් සිය වගා බිම් අස්වද්දමින් ඉන්නවා. නොවැම්බර් 15 වැනිදා වන විට අපේක්ෂිත ඉලක්කයේ සාධනීය තත්ත්වයක් අපි අපේක්ෂා කරනවා යැයිද කුමාර මහතා කියයි.

## ගල්ගමුවේ ධීවරයන්ට රජයෙන් ආම්පන්න



**ගල්ගමුව මැතිවරණ කොට්ඨාසයේ ප්‍රධාන වැව් 7 ක් ආශ්‍රිතව ධීවර කටයුතුවල යෙදෙන ධීවරයින්ට රුපියල් ලක්ෂ 50 ක් පමණ වටිනා ධීවර ආම්පන්න බෙදා දීමේ වැඩසටහනක් පැවැත්වූ බව වයඹ පළාත් ධීවර අමාත්‍යාංශය කියයි.**

ගල්ගමුව, මැදිවච්චිය වැව් තාවුල්ලේදී මේ වැසඩහන පැවැත්වූ අතර උස්ගලසියඹලන්ගමුව, මැදවච්චිය, ගිරිබාව, ඉගිණිමිටිය, තෝරව, මහගල්ගමුව, පාළුකඩවල යන වැව් ආශ්‍රිතව ධීවර කටයුතුවල යෙදෙන අයට මේ ආම්පන්න ලබා දුන්හ.

ඔරු දැල්, කොල්ලෑ ජීවිත ආරක්ෂිත කබා, මාළු අලෙවි පෙට්ටි, ජංගම කුඩාරම් ආදී උපකරණ මෙහිදී ධීවරයින්ට ලබා දුන් බව වයඹ පළාත් ධීවර අමාත්‍යාංශය කියයි.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා ගල්ගමුව සම්බන්ධීකරණ කමිටු සභාපති අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මේ වැඩ සටහනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති එච්.කේ. විමලරත්න එහි මන්ත්‍රීවරුන් වන සුනිල් බණ්ඩාර, ඩිලානි ලක්ෂිකා, වයඹ පළාත් ධීවර අධ්‍යක්ෂ සූරාජ් සිරිසේන යන මහත්ම මහත්මීහු ඇතුළු ධීවර සමිති නිලධාරීහු ප්‍රතිලාභීහු මේ අවස්ථාවට එක්වූහ.

**(ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ සහ අඹන්පොළ අනිල් ගාමිණී විජේරත්න)**

## බතළගොඩ හා කිඹුල්වානා ඔය සියලු කුඹුරුවල වී වපුරනවා

### හිරියාල වාරි ඉංජිනේරු දසාන් රත්නායක

**(මොරගොල්ලාගම සිසිර කැලේගම)**

**බතලගොඩ හා කිඹුල්වානා ඔය ව්‍යාපාර යටතේ ඇති සියලු කුඹුරුවල මෙවර මාස් කන්නයේ වී වැපිරීමට කටයුතු කර ඇතැයි හිරියාල වාරිමාර්ග ඉංජිනේරු දසාන් රත්නායක මහතා කියයි.**

ප්‍රදේශයට පතිත වූ මහ වැසි හේතුවෙන් බතලගොඩ ජලාශයට අක්කර අඩි 5000ක හා කිඹුල්වානා ඔය ජලාශයට අක්කර අඩි 6900 උපරිම ජල ධාරිතාවයක් ලැබී තිබෙන බවද රත්නායක මහතා පැවසීය.

ඒ අනුව බතලගොඩ ව්‍යාපාරය යටතේ කුඹුරු අක්කර 8000 ක් හා කිඹුල්වාන ව්‍යාපාරයේ කුඹුරු අක්කර 2450 ක සම්පූර්ණයෙන්ම වී වගා කර අවසන් බවද වාරි ඉංජිනේරුවරයා සඳහන් කළේය.

හිරියාල වාරි ඉංජිනේරු කාර්යාලය යටතේ වාරිමාර්ග වැව් 11ක් තිබෙන බවත්, ඊට අයත් සියලු කුඹුරුවල වගා කිරීම් මේ වනවිටත් සිදුවෙමින් පවතින බවත් ඒ මහතා පෙන්වා දෙයි.

රසායනික පොහොරවලින් තොරව කාබනික පොහොර භාවිතයෙන් අපේක්ෂිත අස්වැන්න ගත නොහැකි වුවත් අහස උසට බඩු මිල ඉහළයාම හමුවේ කෑමට නොව ලෙව කන්නට හෝ වී ඇටයක් ගැනීම උදෙසා අන් මාවතක් නොමැති නිසා අකමැත්තෙන් වුවද වී වගා කිරීමට පියවර ගත් බව බතලගොඩ ව්‍යාපාරයේ ගොවීහු පිරිසක් දැඩි කලකිරීමකින් යුතුව පැවසූහ.

## පොහොර ප්‍රශ්නය නිසා පාරක බැහැලා යන්න බෑ

### වැඩියෙන්ම බනින්නේ කාන්තාවන්

### ගල්ගමුවේ මන්ත්‍රී සේනාධීර කියයි

**(ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ)**

**පොහොර ප්‍රශ්නය නිසා අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුටවත් පාරට බැස ගමන් කළ නොහැකි තත්ත්වයක් උදාවී ඇතැයිද වැඩිපුරම දෝෂාරෝපණය කරන්නේ කාන්තාවන් බවත් ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී අයි.එම්. උපාලි සේනාධීර මහතා එජනිස කියයි.**

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ඉකුත් මාසික සභාව පැවැත්වූ ඔක්තෝබර් 12 වැනිදා සභාව අමතා මන්ත්‍රීවරයා එසේ ප්‍රකාශ කළ අතර එහිදී ඔහු මෙසේද කීය.

කාබනික හෝ රසායනික පොහොර දෙකම නැතිව අද ගොවියා අසරණ වී සිටිනවා. මමත් ගොවියෙක්. මෙතැන ඉන්න වැඩි පිරිසක් ගොවිතැනින් ජීවත් වෙන්නේ. බඩ ඉරිඟු හා එළවළු වගාවෙන් අද අපේ ප්‍රදේශයේ ගොවියා ඇත් වෙලා. අපේ ප්‍රදේශවල ටිකක් ව්‍යාපාරික මට්ටමින් ගොවිතැන් කරන ගොවියා අද එයින් සම්පූර්ණයෙන් ඈත් වෙලා. කෑමට පමණක් ඔවුන් වගා කරන බව කියනවා.

පසුගිය යල් කන්නයේ යම් ප්‍රමාණයකට රසායනික පොහොර දුන්නා. ඒත් පොහොර මදිකම නිසා හැම කුඹුරු ඉඩමකින්ම සීයට 40 සිට 50 ක පමණ අස්වැන්නක් අඩුවීමක් තිබුණා. මේක අපි දන්න කාරණාවක්. අපි මේ සම්බන්ධයෙන් කතා කරලා ගොවියා බේරාගත යුතුයි.

මේ පොහොර ප්‍රශ්නය නිසා අනාගතයේදී ආහාර අර්බුදයක් ඇති වෙන්න පුළුවන්. කංකුං ටික පවා පිටරටින් ගෙන්වන්න වෙයි. ගොවීන් නගන මේ මැසිවිලි අඳෝනා ගැන අප කතා කළ යුතුයි. අද ගොවියා හැමදම පාරේ උද්ඝෝෂණ කරනවා. ඒ නිසා මේ ගැසට් පත්‍රය අවලංගු කර මේ ප්‍රශ්නයට විසඳුම් දෙන්න ඕනෑ.

ගම්වලට ගිහින් බලන්න. සමහර ගොවීන් අක්කර 10 ක විතර බඩ ඉරිඟු වගා කරනවා. අද සියලු දෙනාම ඒ වගාවෙන් ඉවත් වෙලා. අපට පාරක යන්න බෑ. බනිනවා. වැඩිපුරම බනින්නේ කාන්තාවන්. මේ ගැන ආණ්ඩුවේ බලධාරීන්ට කියන්න. නම්‍යශීලී වෙන්න කියන්න. ගොවි ජනතාව වෙනුවෙන් මධ්‍යස්ථ ගමනක් යන්න කියන්න. මගේ පෞද්ගලික යෝජනාවක් ලෙස හෝ මෙය යොමු කරන්නැයිද සේනාධීර මහතා සභාවෙන් ඉල්ලීමක් කළේය.

## නිරෝධායනය වන දරුවන් ගෙවල්වල තබා මවුපියන් ඇවිදීම අතිශය භයානකයි

### පොල්පිතිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී රත්නායක

**(මොරගොල්ලාගම සිසිර කැලේගම)**

**නිරෝධායනය වන පවුල්වල දරුවන් නිවෙස්වල තබා මාපියන් ජනතාව අතරේ ගැවසීම අතිශය භයානක තත්ත්වයක් බව පොල්පිතිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සුනිල් රත්නායක මහතා පවසයි.**

පොල්පිතිගම නගරයේ පැවැති ගුරු උද්ඝෝෂණවලට, ගොවි උද්ඝෝෂණවලට හා බැංකුවලට පොහොර ගැනීමට ගොස් ජනතාව අතරේ රැඳී සිටින නිරෝධායන වෙන පවුල්වල සාමාජිකයින් දැනුවත් කරමින් රත්නායක මහතා ඒ බව ප්‍රකාශ කළේය.

**එහිදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා මෙසේ ද කීය.**

දීර්ඝ නිවාඩුවකින් පසුව ඇතැම් පාසල් දැන් පටන් ගෙන තිබෙනවා. පාසල් පටන් ගැනීමෙන් අනතුරුව පොල්පිතිගම අධ්‍යාපන කලාපයට අයත් පාසල් අතරින් ශිෂ්‍ය නායකයෙකු හා සිසුන් කිහිප දෙනෙකු පෙන් වූ රෝග ලක්ෂණ අනුව වහාම එම පාසල්වලට ගොස් පී.සී.ආර්. පරීක්ෂණ කර පැය කිහිපයක් ඇතුළත දී ඔවුන්ට කොවිඩ් 19 රෝගය ව්‍යාප්ත වී තිබෙන බව තහවුරු කරන්නට අප මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යුහුසුලුව කටයුතු කෙරුවා.

ඒ අනුව කොවිඩ් 19 වයිරසය වැළඳුණු සිසුන් පස් දෙනෙකු වහාම ආරක්ෂිත රෝහල්වලට ඇතුළත් කර ඔවුන් ඇසුරු කළ සිසුන්, ආශ්‍රිතයින් ද පාසල්වලින් ඉවත් කොට ඔවුන් තම නිවෙස්වල නිරෝධායනයට යොමු කිරීමට සෞඛ්‍ය අංශ පියවර ගත්තා.

ඊට අමතරව වෙනත් රෝගීන් ඇසුරු කළ ආශ්‍රිතයින් 87 දෙනෙකු සම්බන්ධව කළ පී.සී.ආර්. පරීක්ෂණවල දී ඉන් 16 දෙනෙකුට පොසිටිව් බවට කරුණු හෙළි වුණා.

ඔවුන් ඇසුරු කළ ආශ්‍රිතයින් කවුද කියා සොයා ගැනීම පවා අසීරුය. එවැනි තත්ත්වයක කැස්ස, හෙම්බිරිස්සාව, උණ රෝග ලක්ෂණ ඇති සිසුන් පාසල්වලට පැමිණීමේ යම් අඩුවීමක් පවා දක්නට තිබෙනවා.

ඒ දෙසට අවධානය යොමුකර නිරෝධායනය වෙන පවුල්වල තත්ත්වය පරීක්ෂා කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඒ නිවෙස්වලට යාමේ දී දරුවන් එහි ඉන්නවා. වැඩි හිටියන් විවිධ උද්ඝෝෂණවලට සහයෝගය දෙන්නට හා බැංකුවලට පොහොර ආධාරය ගන්නට ගිය බවට තොරතුරු හෙළි වුණා.

ඒ අනුව අපි පොල්පිතිගම බල ප්‍රදේශයේ පැවැති ගොවි හා ගුරු උද්ඝෝෂණවලටත් ගියා. පොහොර ගන්න සිටි බැංකු පෝලිම්වලටත් ගියා. නිරෝධායනය වෙන පවුල්වල අය ඒ පෝලිම්වල හිටියා. ඔවුන් ඉන් ඉවත් කිරීමට කටයුතු කෙරුවා. රැස්ව සිටි අය පවා ඔවුනට දෙස් නැගුවා. තමන් තමන්ට අවංක නොවෙනතාක් කල් කොරෝනා ව්‍යසනයෙන් තමන් හෝ තම දරුපරපුර බේරා ගැනීම සෞඛ්‍ය අංශවලට පමණක් තනිව මැඩළිය නොහැකි බවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී රත්නායක මහතා වැඩිදුරටත් පැවසීය.


ඇබෑර්තු
කුරුණෑගල

වයඹ (කුරුණෑගල)
ආරම්භ කිරීමට නියමිත
කාර්යාලයට
දුරකථන ක්‍රියාකරවන්නියන්,
වෙළඳ මහත්මීන්,
හඳුන්වාදීමේ නිලධාරිනියන්
ඉතා ඉක්මනින් අවශ්‍යයි.
සම්මුඛ පරීක්ෂණ සඳහා

විමසීම්:
077-5025818

2022
පොත් ලැයිස්තුව
අඩුම මිලට අපෙන්
උසස්ම ප්‍රමිතියෙන් යුත්
පාසැල් උපකරණ හා ලිපි ද්‍රව්‍ය
ඉතා අඩු මිලට
තොග හා සිල්ලරට
සම්පත් පොත්හල
49, කොළඹ පාර, කුරුණෑගල. (පොලිසිය ඉදිරිපිට)
077 950 8500
ශාඛා - 24, නුවර පාර, කුරුණෑගල. (උසාවිය ඉදිරිපිට)
077 950 80 85
ටෙලි/ෆැක්ස් : 037 2222696

රජයට අනුබද්ධ බෙදාහැරීමේ කාර්යාලයට කුරුණෑගල අවටින් පරිගණක දැනුම ඇති ලිපිකාරිනියක් අවශ්‍යව ඇත.
0778626674
0716681980

රැකියා ඇබෑර්තු
කුරුණෑගල විසිතුරු මසුන් අපනයන පෞද්ගලික සමාගමකට සේවකයින් බඳවා ගැනේ. ආයතනය තුළ නතර වී වැඩ කළ හැකි, වයස අවුරුදු 18-30 අතර අවිවාහක පිරිමි අය විය යුතුය. ආරම්භයේදී රු. 35000.00 ඉක්මවූ වැටුපක් ලබා ගත හැක. පුහුණු කාලය සාර්ථකව අවසන් කරන සේවකයින් වැටුප් වර්ධක සහ රජයේ අනුමත සියලු දීමනා සහිතව ස්ථිර සේවකයින් ලෙස පත් කරනු ලැබේ.
0703333545 / 0702603332
(පෙ.ව. 8.00 - ප.ව. 5.00 කාලය තුළ අමතන්න)
ඇක්වාලිෆයිඩ් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම
රංජනගම, කුරුණෑගල.

රැකියා ඇබෑර්තු
අංක 140/2/1 දෙවන මහල, කොළඹ පාර, කුරුණෑගල ලිපිනයෙහි පිහිටි හිරුසර විදේශ රැකියා ආයතනය සඳහා කළමනාකරුවෙකු සහ ලිපිකරුවෙකු සඳහා හදිසි ඇබෑර්තු ඇත.
072-1008080
දුරකථන අංකයට අමතන්න

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලය
ඉබ්බාගමුව
පාරිශ්‍රමික ගෙවීම් යටතේ බඳවා ගැනීම් - 2022

ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලයේ 2022 වර්ෂයට පහත බඳවා ගැනීම් සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| ගුරුභවතුන් | | අනධ්‍යනයන කාර්ය මණ්ඩල අවශ්‍යතා | |
|---|---|---|---|
| හින්දි විෂය | 01 | ආරක්ෂක සේවා කාන්තා | 01 |
| ජපන් විෂය | 01 | වතු කම්කරු | 01 |
| - | - | නේවාසිකාගාර පාලක සහයක (අවු.40 - 50) | 01 |
| - | - | නේවාසිකාගාර පාලිකා සහයක (අවු.40 - 50) | 01 |

● ඉහත තනතුරු සඳහා තමන් විසින් සකසාගත් ජීව දත්ත ඇතුළත් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.
● නිසිලෙස සම්පූර්ණ කරගත් අයදුම්පත්‍ර 2021.11.28 දිනට පෙර **විදුහල්පති, මධ්‍ය විද්‍යාලය, ඉබ්බාගමුව** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. ඔබ එවන ලිපියෙහි වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු බවද දන්වමි.

විදුහල්පති

## ගල්ගමුවේ පාසල් දරුවන්ටත් කොරෝනා එන්නත්



**ගල්ගමුව අධ්‍යාපන කොට්ඨාසයේ පාසල්හි ඉගෙනුම ලබන වයස අවුරුදු 18-19 අතර වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කොරෝනා මර්දන එන්නත ලබාදීම පසුගිය 25 වැනිදා ආරම්භ කළ බව සෞඛ්‍ය බලධාරිහු කියති.**

ගල්ගමුව යූ.බී. වන්නිනායක ජාතික පාසලේ දී මේ එන්නත්කරණ වැඩ සටහන ආරම්භ කළ බවත් එහිදී ෆයිසර් එන්නතේ පළමු මාත්‍රාව පාසල් ළමුන්ට ලබාදෙන බවත් සෞඛ්‍ය නිලධාරිහු කියති. ගල්ගමුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා වෛද්‍ය නිලධාරි කාර්යාලයේ කාර්ය මණ්ඩලය මෙම එන්නත්කරණ වැඩ සටහන ක්‍රියාත්මක කරති.

(සේයා සටහන- ගල්ගමුව නිහාල් ජයවීර)

## පොල්පිතිගම දුප්පතුන්ට ලක්ෂ දහයක නිවාස ආධාර



**සෞභාග්‍යා දැක්ම ප්‍රතිපත්තියට සමගාමීව "ඔබට ගෙයක් රටට හෙටක් "සංකල්පය යටතේ සෑම ග්‍රාම සේවා වසමකින්ම තෝරා ගත් එක් අඩු ආදායම් ලාභියෙකුට නිවෙසක් සාදා ගැනීම සඳහා ලක්ෂ හයක නිවාස ආධාරයක් නිවාස සංවර්ධන අධිකාරිය මැදිහත්ව ප්‍රදානය කරයි.**

ඒ යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් තෝරා ගත් නිවාසලාභීන්ට මුල් අදියර යටතේ රුපියල් ලක්ෂය බැගින් ප්‍රතිපාදන ලබා දීමක් සිදුකළ අවස්ථාවේ දී පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ සභාපති රංජිත් විජේනායක මහතා කෝරුවාව ප්‍රදේශයේ දී නිවාස ලාභියෙකුට හිමි චෙක්පත ප්‍රදානය කළ අයුරු.

(මොරගොල්ලාගම සිසිර කැලේගම)

## මහවැලි එච් කලාපයට කලාවැවෙන් දියවර




**දෙදහස් විසිඑක, විසි දෙක (2021-22) මාස් කන්නය සඳහා මහවැලි 'එච්' කලාපයට ජලය නිකුත් කිරීම පසුගිය 01 වැනිදා සිදුකළ බව මහවැලි බලධාරිහු කියති.**

කලාවැවේ සකර මහා දේවාලවල පැවැත් වූ කිරි ඉතිරීම මංගල්‍යයෙන් පසු කලා වැවේ සොරොව් දොරටු විවෘත කොට මේ කාර්යය සිදුකළ බව ද ඔවුහු කියති.

මීගල්ලෑව, ගල්නෑව, නොච්චියාගම, එප්පාවල, තලාව, මහ ඉලුප්පල්ලම ... යන මහවැලි කොට්ඨාස 'එච්' කලාපයට අයත්වන අතර මුළු කලාපයේම කුඹුරු ඉඩම් අක්කර 139,025ක් වෙයි.


ජලය නිකුත් කරන අවස්ථාවට කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න, අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. බී. එස්. කුමාරසිරි, උතුරුමැද ... එස්.එම්. රංජිත්, 'එච්' කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු සුගත් විජේසිංහ යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

(සේයා සටහන- ගල්ගමුව ඇන්. ජේ. පතිරාජ)




# අවුරුදු 72 ක් තිස්සේ වුණේ ඉහළ නිලධාරීන් සතුටු කරන්න වාර්තා සැපයීම විතරයි

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළ අංශයේ හිටපු ක්ෂේත්‍ර සහකාර ඩබ්ලිව්.එම්. කරුණාරත්න**



**ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය හා එහි නිරතවන්නන් මේ වන විට විවිධ අර්බුදයන්ට මුහුණ පා සිටින බව බොහෝ දෙනා පවසති. පොහොර ප්‍රශ්නය, කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟය හා අධික මිලක් නියම කිරීම, ට්‍රැක්ටර්, කොළ මඩින යන්ත්‍ර ආදියෙහි කුලිය ඉහළ යාම, අස්වැන්න අලෙවි කර ගැනීමේ දී මතුවන ගැටලු, බීජ සම්බන්ධයෙන් මතුව ඇති ප්‍රශ්න මේ අතර ප්‍රධාන වන බව කෘෂිකර්මාන්තයේ නියැලෙන්නෝ පවසති.**

මේ විවිධ ප්‍රශ්න අතුරින් බීජ ප්‍රශ්නය කෘෂිකර්ම අර්බුදයට බලපා ඇත්තේ කුමනාකාරයෙන් දැයි සාකච්ඡා කිරීමට රාජකාරි ජීවිතයේ දී මෙන්ම කෘෂි කර්මාන්තයේ ප්‍රායෝගිකව නිරත වීමෙන් ලැබූ අත්දැකීම් ඇති විෂය පිළිබඳව ප්‍රාමාණික දැනුමැත්තෙකු සම්බන්ධ කර ගතිමු. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපොළ අංශයේ ක්ෂේත්‍ර සහකාර ලෙස අවුරුදු 25ක් සේවය කොට දැන් විශ්‍රාමිකව සිටින මහු ගල්ගමුව, සියඹලෑව හත්දියේ පදිංචි ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතාය. මේ ඒ මහතා සමඟ කළ සංවාදයක සටහනකි.

**ප්‍රශ්නය:- කෘෂිකර්මාන්තයේ අර්බුදයට බීජ ප්‍රශ්නය බලපාන්නේ කොහොම ද?**

**පිළිතුර:-** අද අපේ රටේ වැඩිපුරම භාවිත කරන්නේ විදේශීය දෙමුහුන් බීජ වර්ගයන්. දේශීය බීජ හිඟකමක් තියෙනවානේ. මේ විදේශීය දෙමුහුන් බීජවල මිල ඉතා අධිකයි. මාළු මිරිස් බීජ ග්‍රෑම් 10ක් රුපියල් 5,000ක් විතර වෙනවා. එතකොට කිලෝ එකක් කීයද කියලා ගණනය කර ගන්න පුළුවන්නේ. මේ විදේශීය දෙමුහුන් පැළයක් බීජ ඇටයක් අන්තිම රුපියල් 20ක්වත් වෙනවා. මේ නිසා සාමාන්‍ය ගොවියකුට මේ ඉහළ මිල දරාගන්න අමාරුයි.

අනික මේ විදේශීය දෙමුහුන් බීජවලින් රෝපණය වන වගාවන්ට අධික ලෙස කෘෂි රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරන්න ඕන. හැදෙන රෝග වැඩියි. විශේෂයෙන් එළවළු වගාවේ දී අපි ඒක දකිනවා. දිලීර රෝග, කොළ හැකිළෙන රෝග මේවාට වැඩියි. ඉතිං නිතර නිතර රසායනික ද්‍රව්‍ය යොදන්න වෙලා තියෙනවා. කාලාන්තරයක් තිස්සේ මේ දෙමුහුන් බීජ රසායනික ද්‍රව්‍යවලට හුරුවෙලා තියෙන්නේ. ඒ නිසා කෘමිනාශක, දිලීර නාශක වැඩි වැඩියෙන් යොදන්න වෙලා තියෙනවා. ඒකේ අවසාන ප්‍රතිඵල කීයක් තියෙනවා. නිෂ්පාදන වියදම ඉහළ යාම ප්‍රධානයි.

ඊළඟට ඔය විදේශීය දෙමුහුන් බීජවලින් හට ගන්න එළවළු දෙස බලන්නකෝ. තක්කාලි, මාළු මිරිස්, වට්ටක්කා ආදියේ පිටපැත්ත දිලිසෙන ගෙඩියක් වගේ ගණකමයි. ඒ කියන්නේ ගෙඩියේ ආවරණ සිවිය නැත්නම් මතුපිට සිවිය හැදෙ ගතියකින් යුක්තයි. අපේ දේශීය බීජවල ගෙඩි, කරල්වල මේ තත්ත්වය නෑ. අපි ගොරක තක්කාලි නමින් හඳුන්වන තක්කාලි ගෙඩියෙ පිට ආවරණය මොළොක්. මාළු මිරිස්වලත් එහෙමයි. ඒවා ආහාරයට ගත්විට දිරවීමේ පහසුවක් තියෙනවා.

මේ දෙමුහුන් බීජ සඳහා යොදන අධික රසායනික ද්‍රව්‍ය සෞඛ්‍ය ප්‍රශ්න ඇති කරන්නත් බලපානවා. බැර ලෝහ මේ ගෙඩිවල නැහැයි කියන්න පුළුවන් ද? හැබැයි ලංකාවේ දැන් දේශීය දෙමුහුන් බීජ වර්ග නිෂ්පාදනය කරන්න පටන් අරන් තියෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් දැනට දේශීය දෙමුහුන් මිරිස් බීජ නිෂ්පාදනය කරනවා. මෙතන් ඒ බීජ වලින් වගා කරලා තියෙනවා. මිල ටිකක් ඉහළයි. නමුත් සෞඛ්‍යයට හොඳයි.

> **ගොවි සංවිධානවලත් අද ප්‍රධාන කටයුත්ත කොන්ත්‍රාත් කිරීමයි. නිලධාරීන් තුන් හතර දෙනා එකතු වී ඒ කටයුතු කරනවා. ගනුදෙනු ගැන විනිවිද භාවයක් නෑ. මේවා නියාමනයක් වෙන්නේ නෑ**

> **වසමකට ග්‍රාම නිලධාරි විතරක් හිටියාම ඇති. අනෙක් තනතුරුවලින් ප්‍රයෝජනයක් නෑ. රජයෙන් විශාල ලෙස වැටුප් ලබන නමුත් ගොවියාට ප්‍රතිලාභයක් නැති මේ තනතුරු තවදුරටත් තියාගෙන සිටීම මට නම් ප්‍රශ්නයක්**

> **උපදේශන සේවය ඉතාම දුර්වලයි. එදා හිටියේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවා නිලධාරි. අද ඒ තනතුර හඳුන්වන්නේ කෘෂිකර්ම උපදේශක නිලධාරි කියලා. ඒත් මේ උපදේශන සේවය ගැන නම් සෑහීමකට පත් වෙන්න බෑ**

**ප්‍රශ්නය:- දේශීය බීජ වගා කිරීමෙන් අස්වැන්නේ අඩුවක් පවතින බව කියනවා. මේ ගැන ඔබේ අදහස**

**පිළිතුර -** ඔව්, අස්වැන්නේ අඩුවක් බලාපොරොත්තු වෙන්න වෙනවා. හැබැයි පිරිවැය අඩුයි. ඒ නිසා දෙක සමතුලිත වෙනවා. අනික මේ දේශීය බීජවලින් ගුණාත්මක අස්වැන්නක් ගන්න පුළුවන්. ශරීර සෞඛ්‍යටත් හොඳයි. එද අපේ පියවරුන් උදේට බත් පිඟානක් පුරවාගෙන සම්බෝලයි, කරවල කැල්ලක් පුච්චාගෙන තමයි කෑවේ. හොඳට බත් ටික කෑවා. හේතුව ඒ සහල්වල තිබුණු ගුණාත්මක බව. දැන් මොන ව්‍යංජනය එක්ක කෑවත් ප්‍රියතාවයක් නෑ නේ ද?''

**ප්‍රශ්නය- අපේ ආහාර වේල ගුණාත්මක නෑ කියලා ඔබ කියන්නේ මේ විදේශීය දෙමුහුන් බීජ හා රසායනික ද්‍රව්‍ය නිසා කියලනේ. මේ ක්‍රමය ක්ෂණිකව වෙනස් කළ හැකි ද?**

**පිළිතුර-** ඒක මෙහෙමයි. ගොවියාට රසායනික පොහොර වගාවට යොදන ක්‍රමවේදය ගැන අවබෝධයක් නෑ. ඒ වාගෙම කාබනික පොහොරට යෙදීම ගැනත් දැනුවත් බවක් නෑ. ඒ නිසා ඉක්මණින් ඒ ක්‍රමයට යන්න බෑ. අස්වැන්න නෙළා ගත් ගමන් ඊළඟ වගාව කරනතුරු වගාවක් සරුසාර කරන්න ඕන. අපි හිතමු ගොයම් කපලා ඉවරයි කියලා. ඒ අවසන් වූ ගමන්ම ජීර්ණාධික, ස්වභාවික කොළ අතු, පිදුරු, ගොම වගේ ද්‍රව්‍යය කුඹුරට එකතු කරන්න ඕන. නමුත් යම් ප්‍රදේශවල මේක ප්‍රායෝගික නොවන්න පුළුවන්. ජනාකීර්ණ ජනපදම අද ගොම පොහොර සීමිතයි. හරක් වැඩිය නෑනේ. කොළ අතු පවා හිඟයි. අනික් පැත්තෙන් බලනවා නම් අපි ගෙවල් හදන්න මනම්පිටියෙන් වැලි ගේන්නේ. ඒ වාගේ ක්‍රමවේදයකට යන්න වෙනවා.

**ප්‍රශ්නය - රසායනික හෝ කාබනික පොහොර යෙදීම සම්බන්ධයෙන් ගොවීන්ට දැනුමක් නෑ කියනවා. මේ දැනුම ඔවුන්ට ලබා දීමට නිලධාරීන් ඉන්නවා නේද?''**

**පිළිතුර:-** විෂය පිළිබඳව දැනුමක් ඇති ඉහළ නිලධාරීන් එකතු වී තීන්දු, තීරණ, යෝජනා අරන් ඒවා චක්‍රලේඛ, ලිපිලේඛන ආදිය මගින් ප්‍රාදේශීය මට්ටමට බෙදහරිනවා. ප්‍රාදේශීය ඉන්න නිලධාරීන්ගෙන් ඒ දැනුම ගම් මට්ටමට යනවිට ප්‍රායෝගිකව වෙන්නේ නෑ. දුර්වලතා තියෙනවා. දැන් වසමක සාමාන්‍යයෙන් පවුල් 400ක් විතර තමයි ඉන්නේ. වසමක රාජ්‍ය නිලධාරීන් පස් දෙනෙක් ඉන්නවා. ඒ අය කරන්නේ ඉහළට තොරතුරු දීම විතරයි. ප්‍රධාන රාජකාරිය ඒකයි.

මීට අමතරව ගොවි සංවිධාන තියෙනවා. ගොවි සංවිධානවලත් අද ප්‍රධාන කටයුත්ත කොන්ත්‍රාත් කිරීමයි. නිලධාරීන් තුන් හතර දෙනා එකතු වී ඒ කටයුතු කරනවා. ගනුදෙනු ගැන විනිවිද භාවයක් නෑ. මේවා නියාමනයක් වෙන්නේ නෑ. රටේ හැම තැනම එහෙම තමයි. ඉතින් ගොවීන්ට උපදෙස් දෙන්න. දැනුම දෙන්න රාජ්‍ය නිලධාරීන් හෝ ගමේ ස්වේච්ඡා සංවිධානවල නිලධාරීන් කටයුතු කරන්නේ නෑ. ඒ අපට වෙන රාජකාරී තියෙනවා. මගේ නම් අදහස වසමකට ග්‍රාම නිලධාරි විතරක් හිටියාම ඇති. අනෙක් රාජ්‍ය නිලධාරීන් ඒ තනතුරුවලින් ප්‍රයෝජනයක් නෑ. රජයෙන් විශාල ලෙස වැටුප් ලබන නමුත් ගොවියාට ප්‍රතිලාභයක් නැති මේ තනතුරු තවදුරටත් තියාගෙන ඉදීම මට නම් ප්‍රශ්නයක්.

**ප්‍රශ්නය:- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එද සහ අද තත්ත්වය ඔබ දකින්නේ කොහොමද?**

**පිළිතුර -** එදට වඩා අලුත් නිෂ්පාදන ක්‍රමවේදයන්ට දෙපාර්තමේන්තුව අද ගිහින් තියෙනවා. දියුණු තාක්ෂණික උපකරණ යොදාගෙන දියුණු බීජ නිෂ්පාදනය කරනවා. ගුණාත්මක බීජ වර්ග හා රෝපණ ද්‍රව්‍යවල දියුණුවක් තියෙනවා. හැබැයි ප්‍රාදේශීය මට්ටමින් සියලුම ගොවීන්ට මේ ප්‍රතිලාභ ක්‍රමවේදයකට යන්නේ නෑ පසු විපරමක් නෑ. අඹ පැළයක් දෙනවා. හැදුවාද?, නැද්ද? කියලා සොයා බැලීමක් නෑ. දිවි නැගුම වැඩසටහන අසාර්ථක වුණේ ඒකයි.

අනික් කාරණය තමයි උපදේශන සේවය ඉතාම දුර්වලයි. එද හිටියේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවා නිලධාරි. අදත් ඒ තනතුර හඳුන්වන්නේ කෘෂිකර්ම උපදේශක නිලධාරි කියලා. මේ තනතුරේ වගකීම තමයි කෘෂිකර්මය දියුණු කිරීමට අදාළ යෙදවුම් හා වගා කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිස් සඳහා ඒවා ලබාදීම. වගා කටයුතු සම්බන්ධයෙන් රෝග පාලනය සම්බන්ධයෙන් උපදෙස් දීම. අද මේ උපදේශන සේවය ගැන නම් සෑහීමකට පත් වෙන්න බෑ. අද ගොවියාට සිද්ධ වෙලා තියෙන්නේ භෝගයකට රෝගයක් හැදුණාම තෙල් පොහොර වෙළෙන්දගෙන් උපදෙස් ලබා ගැනීමටයි. මේ හැම නිලධාරියෙක්ම අද කරන්නේ ඉහළ නිලධාරීන් සතුටු කරන්න වාර්තා සැපයීම විතරයි. අවුරුදු 72ක්ම ඕකනේ කළේ.

**ප්‍රශ්නය - බීජ ප්‍රශ්නය ඇතුළුව කෘෂිකර්මාන්තය මුහුණ දෙන සෙසු අර්බුදවලින් මිදීමට නම් ගත යුතු පියවර මොනවා ද?**

**පිළිතුර -** විදේශීය දෙමුහුන් බීජ වෙනුවට දේශීය දෙමුහුන් බීජ නිෂ්පාදනය කරන්න ඕන. අපේ පසට, දේශගුණයට, පලිබෝධයන්ට ගැළපෙන බීජ නිපදවන්න ඕන. ඒ සඳහා රජයේ ගොවි පොළවල් නැවත පවරා ගත යුතුයි. එද මහ ඉලුප්පල්ලම. බතලගොඩ, හිඟුරක්ගොඩ, පැල්වෙහෙර, ගල්ගමුව, මැදගම, කඩුගන්නාව, අගුණකොලපැලැස්ස වගේ රජයේ ගොවිපොළවල ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කළා. මේවා පෞද්ගලිකරණයත් සමඟ හා විදේශීය දෙමුහුන් බීජ ගෙන්වීමත් සමඟ දේශීය බීජ නිෂ්පාදනය කඩා වැටුණා. වැඩි අස්වැන්නක් ලබා දෙනවා කියා විදේශීය දෙමුහුන් බීජවලට ඉල්ලුම වැඩි වුණා. රජයේ ගොවිපොළවල් එද බලාපොරොත්තු වුණේ ලාභය නෙමෙයි. සේවාවයි. ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

අපේ පැරැණි අය බොහෝ විට වගා කළේ අහස් වැස්සෙන්. වගාව පටන් ගන්න කලින් පෙර සූදානමක් ඒ අයට තිබුණා. ඉතාමත් අඩු ශ්‍රමයකින් බිම් සකස් කර ගත්තා. වර්ෂාව ලැබෙන්න මාසයකට පෙර ඒ කටයුතු කර ගන්නවා. සොබා දහමේ චාර්යාවන් නිරීක්ෂණය කළා. වගාව ගැන තීන්දු තීරණ ගත්තා. බිනර මහට වැහි බිත්තර පේනවා නම්, වැහිලිහිණියන් පියඹනවා නම්, කැදැත්තා හඬලනවා නම් වැස්ස කිට්ටු බව දැන ගන්නවා. සුළඟ චලනය නිරීක්ෂණය කරලා මෝසම් මාරුවෙන බව දැන ගත්තා. මුළු වැස්සම ප්‍රයෝජනයට ගෙන වගාව පටන් ගන්නවා.

පළමු වැස්සේ නැවුම් සුවඳ යන්නට පෙර ධාන්‍ය වර්ග හිටවනවා. වර්ෂාවට භෝගය වැඩෙන පරිදි හා පායන කාලයට අස්වැන්න නෙළන පරිදි කාලය කළමනාකරණය කර ගත්තා. මේ ක්‍රමයට වැය වන පිරිවැය අඩුයි. වැඩි අස්වැන්නක් නම් නෑ තමයි. ඒත් පවුල පෝෂණය කරගෙන දරුවන්ට අධ්‍යාපනය ලබා දී සාර්ථක ප්‍රතිඵල ලැබුවා. නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන රටේ විද්වතුන් වූ බොහෝ දෙනෙක් ඒ ගොවීන්ගේ දරුවන්.''

**ප්‍රශ්නය- මේ පාරසරික වගාවත් එක්ක ඉදිරියට යන්න පුළුවන් ද?**

**පිළිතුර-** හැමෝටම යන්න බැරිවෙයි. නමුත් අපේ ගම්වල තාමත් ඉන්නවා මේ ක්‍රමයට යන පිරිසක්. ඒ අයට සමාජයේ පිළිගැනීමක් ලබා දී හා රැක ගනිමින් ඉදිරියට යන්න පුළුවන්. ඒ සඳහා උදව් කිරීමට, මඟ පෙන්වීමට අදළ අංශවල වගකිවයුතු අය ඉන්නවා. අපේ රටේ බලධාරීන් කියලා ජාතියක් නම් නෑ. උන් ඉන්නේ හොරකම් කරන්න විතරයි. ඒ නිසා මං ඔය බලධාරීන් කියන වචනය පාවිච්චි කරන්නේ නෑ. විෂය බාර නිලධාරීන්ගේ වගකීමක් හා යුතුකමක් වෙනවා මේ පිරිස රැක ගැනීම.

**ප්‍රශ්නය - ඔබ ගෙවතු වගාවට ඇලුම් කරන, ගෙවතු වගාකරුවන්ට අවශ්‍ය පැළ ආදිය සපයන්නෙක්. ඒ සම්බන්ධයෙනුත් අදහස් දක්වමු ද?**

**පිළිතුර -** එද අපේ ගම්වල අක්‍රමවත් ලෙස සකස් කර ගත් ගෙවතු වගාවක් තිබුණා. ඒ වගාව පෝෂණය කළේ නිරුක්සාහකව. මිරිස් ගල තිබුණේ එළියේ. ඒ මිරිස් ගල ආසන්නයෙන් කොච්චි පැළ. මිරිස් පැළ හිටවනවා. මිරිස් ගල හෝදන වතුරින් ඒ පැළ පෝෂණය වුණා. පැපොල් ඉබේ හට ගන්න ඒවා. කිරි හරකාගෙන් කිරි ටික ගොම ටික ලැබුණා. මී හරක් හිටියා. ගොවිතැනට උදව් ලැබුණා. ගොම ටික වගාවට එක්කළා. එළවළු ටිකට, පළතුරු ටිකට අළු ඉහළා රෝග පාලනය කර ගත්තා. කුස්සිය වටේට අවශ්‍ය එළවළු, මිරිස්, ඉඟුරු කහ, වදකහ තිබුණා. අක්‍රමවත් තමයි. හැබැයි ගෙදරට අවශ්‍ය ආහාර ඒ වපසරියේ තිබුණා.

කෙසෙල් පඳුර ළඟ කළගෙඩියක් තියෙනවා. කෙසෙල් මල්වල පැණි ගන්න එන මී මැස්සන් කලයට රිංගලා වද බඳිනවා. මේවා නඩත්තු කරනවාද කියලා දන්නෙත් නෑ.

අද මෙහෙම කරන්න අමාරුයි. ඉඩ කඩක් සීමිතයිනේ. ඒ නිසා බඳුන්ගත එළවළු, පලතුරු වගාව තෝරා ගන්න පුළුවන්. සත්ත්ව පාලනයෙන් තොරව පර්චස් 10ක් මේ වගාව කරන්න පුළුවන්. ප්ලාස්ටික් බැරල් භාගයක කෙසෙල් ගහක් හද ගන්න පුළුවන්. ගෙවත්තත් අලංකාර වෙනවා. නැවුම් එළවළු, පලතුරු ආහාරයට ගන්න පුළුවන්. සෞඛ්‍යාරක්ෂිතයි. නිවෙසට ආර්ථික වාසියක් ලැබෙනවා. කැලි කසළ කළමනාකරණය සිදුවෙනවා. ඩෙංගු වැනි රෝග ව්‍යාප්තිය ඒ මගින් පාලනය වෙනවා. ගෙදර දරුවාට ගහකොළ අඳුනාගන්න හරි අවස්ථාව ලැබෙනවා.

අවසාන වශයෙන් මට කියන්න තියෙන්නේ අපේ රටේ මහා පසු අස්වනු විනාශයක් සිද්ධ වෙනවා. අස්වැන්න නෙළන කාලයට අලෙවිය හා මිල අඩුවෙනවා. හැම භෝගයකටම මේ තත්ත්වය ඇති වෙනවා. ඒ නිසා ඊට පිළියම් යෙදිය යුතුයි. ඒ වාගේම තරුණ පෙළ ගොවිතැනට පෙළඹවීමේ ක්‍රමවේදයක් ඇති කරන්න ඕන. කාබනික හෝ රසායනික මොන ක්‍රමයට ගියත් දේශීය දෙමුහුන් බීජ නිෂ්පාදනය නම් කරන්නට ඕන දෙයක්.

සංවාද සටහන
ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ

# මන්ත්‍රීවරියන්ට සභාවේදී කතා කරන්න දෙන්නේ නෑ; දුන්නත් විනාඩි 5 යි

## පන්නල ප්‍රා.සභා මන්ත්‍රීනි ගයානි දීපිකාගෙන් චෝදනා

**(කුරුණෑගල ජනූර් කිච්ලාන්)**

**මාසික දීමනාව ගන්න උදේ 10 සිට පැය 4 ක් පුටු රත්කරන්න අපට අවශ්‍ය නැහැ. අපි ආවේ ජනතාවට සේවය කරන්නයි. කාන්තාවන්ට සභාවේ කතා කරන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ. ඇතැම් අවස්ථාවලදී විනාඩි 5 ක් දෙනවා. මොනවද විනාඩි 5 ට කතා කරන්න පුළුවන් යැයි මනුසත් සෙවණ සංවිධානයේ සභාපති පන්නල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිනී එජාප ගයානි දීපිකා ජයසිංහ මහත්මිය කියන්නීය.**

දිපිකා ජයසිංහ මහත්මිය මේ බව කියා සිටියේ කුරුණෑගලදී පැවැති මාධ්‍ය සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජයසිංහ මහත්මිය මෙසේද කීවාය.

මසකට වරක් සභාව නියෝජනය කරන කාන්තාවන් තම කොට්ඨාසයේ ආසනයේ ඇති ප්‍රශ්න කතා කරන්න සූදනම් වන විට ආවත් බාධා කරනවා. නැතිනම් විනාඩි 5 ක් කතා කරලා අවසන් කරන්න කියනවා. විපක්ෂය නියෝජනය කරන අපට කතා කරන්න කරුණු ගොඩාක් තිබෙනවා.

කාන්තා කෝටාව සියයට 25 දක්වා වැඩි කරත් සියලු ප්‍රාදේශීය සභා, නගර සභාවල කතාකරන්න වැඩ කරන්න අවස්ථාව කාන්තාවට ලබා දෙන්නේ නැහැ. පළාත් පාලන ආයතනවල නිල කාලය 2022 පෙබරවාරිවල අවසන් වෙනවා. අපිට ජනතාව ඡන්දයක් දෙයිද? වැඩ නොකර. සියලු කාන්තාවන් පක්ෂ භේදයකින් තොරව නැගී සිටිය යුතුයි.

කොට්ඨාසය, ආසනය දියුණු කරන්න ක්‍රමවත් වැඩපිළවෙළක් සකස් කළ යුතුයි. ගොඩනැගිලි ඉදිකිරීම සංවර්ධනය නොවෙයි. අද කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා කෝටි ගණන් වියදම් කරමින් ගොඩනැගිලි ඉදිකරලා වසා දමා තිබනෙවා. මේවා මහජන මුදල්. අපේ අදහස් ගන්න. අපි ජනතාව වෙනුවෙන් සේවයක් කරමු. රැකියා නැති තරුණ තරුණියන් වෙනුවෙන් වැඩක් කළ යුතුයි. හැමෝටම උපාධිය නැහැ. හැමෝටම රජයේ රැකියාවලට යන්න බැහැ. අපේ සභාව තුළින් රැකියා අවස්ථා සලසා දීමට වැඩ පිළිවෙළක් සැකසිය යුතුයි. පුහුණු කිරීම් ස්වයං රැකියා සඳහා කළ යුතුයි. හැමදම විදිලාම්පු සවිකරනවා. මාර්ග ටිකක් සංවර්ධනය කරනවා විතරයි. අලුතින් සිතන අලුත් වැඩ පිළිවෙලකට පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කළ යුතු බවද ජයසිංහ මහත්මිය වැඩිදුරටත් කීවාය.

# රටේ ප්‍රශ්න විසඳන්න නම් රජයත් විපක්ෂයත් එක්වී ජාතික සැලැස්මක් හදන්න ඕනෑ

## ආණ්ඩුවේ මන්ත්‍රී අසංක නවරත්න පෙන්වා දෙයි



**(ගල්ගමුව-නිහාල් ජයවීර)**

**රටේ දැනට උද්ගතව ඇති ආර්ථික හා සාමාජීය ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට නම් ආණ්ඩුව හා විපක්ෂය නියෝජනය කරන පක්ෂ හා එහි නායකයින් එක්ව ජාතික සැලැස්මක් හා වැඩ පිළිවෙළක් සකස්කොට අවුරුදු කීපයක් හෝ එකට වැඩ කළ යුතු යැයි ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක හා කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී (පො.පෙ.) අසංක නවරත්න මහතා කියයි.**

**මීගලෑව, තම්මිටගම ප්‍රදේශයේ පැවැති වැඩසටහනකට එක්වෙමින් ඒ බව ප්‍රකාශ කළ ඒ මහතා මෙසේද කීය.**

කිරිපිටි, ගෑස්, සහල්, සිමෙන්ති ආදි භාණ්ඩවල මිල පාලනය රජය මගින් අත්හැරීම නිසා ඒවාහි මිල විශාල ලෙස ඉහළ ගිහිල්ලා. මේක ජනතාවට දරා ගන්න බැරි තත්ත්වයකට පත්වෙලා. එක පැත්තකින් කොවිඩ් වසංගතයෙන් ජනතාව පීඩනයට පත්වෙලා ඉන්නවා. ඒ අතරතුර අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අසීමිතව ඉහළයාම නිසා අද ජනතාව කබලෙන් ලිපට වැටිලයි ඉන්නේ.

අද මුළු ලෝකයම ආර්ථික වශයෙන් කඩා වැටිලා ඉන්න බව අපි දන්නවා. ඒ වාගේම රටේ විදේශ විනිමය ප්‍රශ්න නිසා ඇතිව ඇති ආර්ථික අර්බුදය ගැනත් අපි හැමෝම දන්නවා. ඒක අපි තේරුම් අරන් ඉන්නේ. නමුත් මිනිසුන්ගේ ජීවත්වීමේ ප්‍රශ්නය ඉතාම නරක අතට හැරිලා තියෙන බව අපි අමතක කරන්න හොඳ නෑ.

මේ ආර්ථික ප්‍රශ්නයට ඉතාම ඉක්මනින් කඩිනම් විසඳුම් ලබා නොදුන්නොත් අපටත් යහපාලන ආණ්ඩුවට අත්වූ ඉරණමට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒ නිසා ජනාධිපති, අගමැති ප්‍රමුඛ අපේ ආණ්ඩුවේ හැමෝම මේ වේලාවේ එක්ව ඒ සඳහා විසඳුම් සෙවීමට කැපවිය යුතුයි.

ඒ වාගේම දැනට රටේ මතුව තිබෙන ආර්ථික හා සාමාජීය ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ සිටින දේශපාලන පක්ෂත් එහි නායකයිනුත් එකතුවෙලා මේ ක්ෂේත්‍ර සඳහා ජාතික සැලැස්මක් හා වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕන. එසේ කරලා අවුරුදු කීපයක් හෝ එකට වැඩ කරන්න ඕන. එහෙම නැතිව මතුව ඇති අර්බුදවලට විසඳුම් සොයන්න බෑ යි එහිදී අසංක නවරත්න මහතා වැඩිදුරටත් කීය.

# යූරියා නැතිව බඩඉරිඟු වගා කරලා වැඩක් නෑ

## ඒ නිසා බඩඉරිඟු ගොවීන්ට යූරියා දෙනවා

## අවශ්‍ය ගොවීන් කඩිනමින් ඉල්ලන්න

## පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගොවීන්ගෙන් ඉල්ලයි

**(අඹන්පොළ ශෂිකලා දර්ශනී)**

**දෙමුහුන් බඩ ඉරිඟුවලින් අපේක්ෂිත අස්වැන්න ලබා ගැනීමට රසායනික පොහොර ලබා දීමට අනුමැතිය ලැබී ඇති බවත් පොහොර අවශ්‍යතාව පවතින ගොවීන් ඒ සඳහා ලිඛිතව ඉල්ලීමක් කළ යුතු බවත් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පවසයි.**

මාස් කන්නයේ බඩ ඉරිඟු වගාවේ ප්‍රගතිය සම්බන්ධයෙන් ඉරිදු ලංකාදීප වයඹ කළ විමසීමේ දී වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ පී. සිසිර කුමාර මහතා මේ බැව් කියා සිටියේය. කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් මෙසේ ද කියා සිටියේය.

මහා පරිමාණයෙන් බඩ ඉරිඟු වගා කරන දිස්ත්‍රික්ක අතරින් කුරුණෑගලත් සුවිශේෂී කලාපයක්. අපේ මෙවර ඉලක්කය වුණේ වගා බිම් අක්කර 5000ක බඩ ඉරිඟු වගා කිරීමටයි. විශේෂයෙන් සත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟුවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. නමුත් අපිට ලැබී ඇති වර්තා අනුව දැනට වගා කර තිබෙන්නේ අක්කර 608ක් වැනි ඉතා සුළු ප්‍රමාණයක්. මේ ප්‍රමාණය අපේ ඉලක්කයට යන්න ප්‍රමාණවත් නෑ. රසායනික පොහොර නොමැති කම නිසා ගොවීන් බඩ ඉරිඟු වගා කිරීමට යම් මැලිකමක් දක්වනවා. ඇත්තෙන්ම සත්ව ආහාර සඳහා වගා කරන දෙමුහුන් බඩ ඉරිඟු රසායනික පොහොර එනම් යූරියාවලට ඉතා සංවේදීයි. යූරියා නොයෙදුවොත් අස්වනු සැලකිය යුතු මට්ටමකින් අඩු වෙනවා. මේ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ වැඩපිළිවෙළක් ලෙස රසායනික පොහොර බඩ ඉරිඟු ගොවීන්ට නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ අනුව රසායනික පොහොර අවශ්‍යතාව තිබෙන ගොවීන් කඩිනමින් ඉල්ලීමක් කරන ලෙස අපි වයඹ ගොවීන්ට දන්වා සිටිනවා.

# මන්ත්‍රී සුමනධීරගේ වැටුප පත්වූදා සිට සෑම මසකම අසරණ පවුල්වලට

**කොවිඩ්-19 වසංගතය පැතිර යාමත් සමගම හා එදිනෙද පරිභරණයට ගන්නා භාණ්ඩ මිල දරාගත නොහැකි ලෙසින් ඉහළ යාම නිසා අසරණ වී සිටින පවුල් තෝරාගෙන සිය මාසික මන්ත්‍රී දීමනාව එම පවුල් අතර බෙද දෙසින් රටටම ආදර්ශයක් ලබා දෙන මන්ත්‍රීවරයකු හලාවත නගරයේ ජීවත් වේ.**

ඔහු නීතිඥ නිහාල් සුමනධීර මහතායි. හලාවත නගර සභාවේ හිටපු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී ඩබ්ලිව්. මයිකල් ප්‍රනාන්දු මහතාගේ හදිසි වියෝව නිසා පුරප්පාඩු වූ මන්ත්‍රී ධූරයට නීතිඥ නිහාල් සුමනධීර මහතා මේ වසරේ අප්‍රියෙල් මස පත් විය. එසේ පත් වූ සුමනධීර මහතා තම මුල් මාසික මන්ත්‍රී දීමනාවේ සිට සෑම මසකදීම තමන්ට හිමිවන මන්ත්‍රී දීමනාව නගරයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත පරිත්‍යාග කළේය. ඒ අනුව මෙම මස ලැබුණ මන්ත්‍රී දීමනාව හලාවත සුපිරි වෙළෙඳසැල ඉදිරිපිට දී හිටපු මන්ත්‍රී හා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහතා අතින් තෝරා ගත් පවුල් කිහිපයක් වෙත පරිත්‍යාග කරනු ලැබීය. මේ එම අවස්ථාවයි. නීතිඥ නිහාල්



සුමනධීර මහතා ද පසෙක සිටී.
(හලාවත - ඔගස්ටින් ප්‍රනාන්දු)

# කොරෝනා සමග ඩෙංගුත් හිස ඔසවයි

**(ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ)**

**ඩෙංගු උණ රෝගය පැතිර යාමේ අවදානම ක් පවතින බවත් ඒ නිසා ඩෙංගු මදුරු කීටයන් බෝවන ස්ථාන විනාශ කර දමන ලෙසත් වයඹ පළාත්වාසී ජනතාවගෙන් සෞඛ්‍ය බලධාරීහු ඉල්ලා සිටිති.**

ඔක්තෝබර් මැද භාගයේ සිට ඊළඟ අවුරුද්දේ ජනවාරි මාසය තෙක් වයඹ පළාතට වැසි සහිත කාල ගුණික තත්ත්වයක් පවතින බවත් මේ කාල සීමාවේ ඩෙංගු මදුරුවන්ගේ ව්‍යාප්තිය ඉහළ යන බවත් සෞඛ්‍ය නිලධාරීහු පවසති.

නිවාස, පාසල් ඇතුළු රාජ්‍ය ආයතන, ව්‍යාපාරික ස්ථාන, ඉදිකිරීම හා වැඩබිම් අඩවියේ හා ආශ්‍රිත පරිශ්‍රය ඇති නැති කුරුම්බා කෝම්බ, පොල්කටු, හිස් ටින්, පොලිතින්, හිස් භාජන ආදී වතුර රැඳෙන ද්‍රව්‍ය විනාශ කර දැමීමෙන් හෝ ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමෙන් ද වහලට දමා ඇති ටයර් හිල් කොට දැමීමෙන් ද මදුරු කීටයන් බෝවන ස්ථාන නැති කර ගැනීමට හැකි බව සෞඛ්‍ය බලධරයෝ පෙන්වා දෙති.

පෙර සඳහන් කළ පරිශ්‍රවල පිහිටි කාණු ජලය බැස යන ආකාරයෙන් සකස් කරන ලෙසත් වැලි පීලි පිරිසිදුව තබා ගන්නා ලෙසත් සෞඛ්‍ය අංශ ජනතාවට දැනුම් දෙයි.

මේ සම්බන්ධයෙන් ගිරිබාව මහජන සෞඛ්‍ය පරීක්ෂක කේ.ඩී.ජී. රත්නායක මහතා මෙසේ කියයි.

වැසි සහිත කාලගුණික තත්ත්වයක් පවතින මේ කාල සීමාවේ ඩෙංගු මදුරුවන්ගේ බෝවීම ඉතාම ඉහළයයි. ඒ නිසා තමයි ඩෙංගු මදුරු කීටයන් බෝවන ස්ථාන හඳුනා ගෙන ඒවා විනාශ කරන්න කියන්නේ. අපි නොසිතනා ස්ථානවලත් අද ඩෙංගු මදුරු කීටයන් ඉන්නවා. ශීතකරණවල වතුර රැඳෙන තැන්වලත්, පරඬැල් පතුවල ජලය රැඳෙන තැන්වලත් ඩෙංගු මදුරු කීටයන් ඉන්නවා.

ඒ නිසා ශීතකරණ සතියකට වරක්වත් පිරිසිදු කරන්න ඕන. පරඬැල් කපා විනාශ කරන්න ඕනෑ. කුඹි උගුල්වල වතුර සතියකට වරක් මාරු කරන්න ඕනෑ. හදුරු, වමනය, තද හිසරදය, ඇස් යට වේදනාව, මාංශපේශි වේදනාව දින දෙකකට වඩා තිබුණොත් රජයේ වෛද්‍යවරයකු හමුවී ප්‍රතිකාර ගන්න ඕනෑ.

ඩෙංගු එන්.එස්.අයි. පරීක්ෂාව කර ගත්තොත් ඩෙංගු වයිරසය ශරීරගත වී ඇත්දැයි සොයා ගන්න පුළුවන්. මේ එන්එස්අයි හා එෆ්බීසී ඒ කියන්නේ පූර්ණ රුධිර පරීක්ෂාව රජයේ සියලුම රෝහල්වලින් නොමිලයේ කර ගන්න පුළුවන් බවද රත්නායක මහතා කියයි.

# ගම්වල පාරවල් සංවර්ධනය දේශපාලකයන්ට සන්තෝෂම් දීමෙන් වැඩ කෙරෙන්නේ ප්‍රමිතියෙන් තොරවයි

## ගල්ගමුව ප්‍රා.සභාවේ හිටපු සභාපති ජිනදාසගෙන් චෝදනා

**(ගල්ගමුව - නිහාල් ජයවීර)**

**ප්‍රාදේශීය දේශපාලනඥයින්ට සන්තෝෂම් ලබාදී කොන්ත්‍රාත්කරුවන් ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම් කරන බවත් මෙය ජනතා මුදල්වලට කරන බලවත් අපරාධයක් බවත් ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී හා හිටපු සභාපතිවරයකු වන ඩී.එච්.එම්. ජිනදස මහතා ඉරිදු ලංකාදීප වයඹට විශේෂ ප්‍රකාශයක් කරමින් කියයි.**

නාන්නේරිය, වැවරණවැටිය ප්‍රදේශයේ සිට වන්නි අමුණුකොළේ ප්‍රදේශය දක්වා වූ මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේදී ද මේ අක්‍රමිකතා සිදුව ඇතැයි ද ඒ මහතා කියයි.

**මේ සම්බන්ධයෙන් ජිනදස මහතා (එජාප) මෙසේ ද කියයි.**

"මේ මාර්ගය සංවර්ධනය කිරීමේදී මුලින්ම පස් මිශ්‍ර ඒ.බී.සී. ගල් ඇතිරුවා. ඒ.බී.සී. ගල් අතුරන විට අඟල් 05 ක් සනකමට අතුරන්න ඕන. ඒත් මේ මාර්ගයේ ඒ ගල් අඟල් දෙක හමාරක් තුනක් විතර සනකමටයි අතුරලා තියෙන්නේ. මාර්ගය දෙපස බොරලු තීරය දැම්මේ නෑ.

මේ සම්බන්ධයෙන් මම සභාවාර කීපයකදී කතා කළා. සභාපතිට දැනුම් දුන්නා. මාර්ග සංවර්ධන ඇමතිගේ ලේකම් මගින් ඉංජිනේරුට දැනුම් දුන්නා. මේ කිසිම එකකින් ප්‍රයෝජනයක් වුණේ නෑ. ඒ දැනුම්දීම කළාට පසුව ටික දවසක් වැඩ නතර කොට නැවත අර විදිහටම වැඩ කරන්න පටන් ගත්තා. අන්තිමට වුණේ ප්‍රමිතියෙන් තොර මාර්ග සංවර්ධනයක් සිදුවී ජනතා මුදල් විනාශ කිරීමක් විතරයි. මේකට හේතුව තමයි කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රාදේශීය දේශපාලනඥයන්ට සන්තෝෂම් ගලායාම."

**ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පැවැත්වූ ඉකුත් 12 වැනිදාද ජිනදස මන්ත්‍රීවරයා මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ අතර එහිදී ඔහු මෙසේ කීය.**

"වැවරණවැටිය - වන්නිඅමුණුකොළේ මාර්ගය ගැන මං මීට පෙර කීප වතාවක් කතා කළා. ඒත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න ඔබතුමාලාට නොහැකි වුණා. දැනට දින කීපයකට පෙර ආර්.ඩී. එකේ ලැබ් එකෙන් පරීක්ෂණයකට එනවා කියලා දැනගෙන අපි කීපදෙනෙක් උදේ 8.00 සිට දහවල් 11.00 විතර වෙනතුරු බලා සිටියා. ඒත් ආවේ නෑ. පසුව දැනගත්තා ඇවිත් ගිහින් කියලා. මේකට මැදිහත් විය යුතු වගකිවයුතු අය මගහැරියා. කිසි කෙනෙක් අඩුපාඩු ගැන විරුද්ධව කතා කළේ නෑ. කතා කළා නම් පාඩුයිනේ. වැටත් නියරත් ගොයම් කා නම් කාට ඒ ගැන මං කියන්නද?

### ප්‍රමිතිය ගැන මම බොහොම උනන්දුයි

### වර්තමාන සභාපති විමලරත්නගෙන් පිළිතුරු

අවසානයේ මට දැනගන්න ලැබුණා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තු මුදලින් අඩු කරනවා කියලා. එසේ වුණා කියලා අඩුපාඩු සකස් වෙන්නේ නෑ. පාඩුව ප්‍රදේශවාසීන්ටයි. දැන් තාර කෝඩ් එකක් දලා නිසා ආර්.ඩී. එකෙන් කාපට් එක දනවා කියලා. ඒ ගැනවත් ඔබලාගේ අවධානය යොමු කරන්න."

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති එච්.කේ. විමලරත්න මහතා ඊට දුන් පිළිතුර වූයේ මාර්ග සංවර්ධනය කිරීමේ ප්‍රමිතිය සම්බන්ධයෙන් තමා දැඩි සේ උනන්දු වූ බවත් තවදුරටත් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන බවත්ය.

# රණවිරුවන්ට උපහාර පිණිස පැළ 26,000 ක් රෝපණය කරයි

**(කරුවලගස්වැව - ජයරත්න වික්‍රමාරච්චි)**

**රට වෙනුවෙන් දිවි පිදූ වීරෝධාර රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා සංවිධානය කළ සුවිශේෂී රුක් රෝපණ වැඩසටහනක් පසුගියද වනජීවී හා වන සම්පත් රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පුත්තලම අඩවි වන සංරක්ෂණ බලප්‍රදේශයට අයත් ඉපලෝගම වන රක්ෂිතයේ දී අභිමානවත් ලෙස පැවැත්විණි.**



එය 'සෑම රණවිරුවෙක් සඳහාම ගසක්' යන සංකල්පය යටතේ ජාතික රුක් රෝපණ මාසයට සමගාමීව වනජීවී හා වන සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ත්‍රිවිධ හමුදාව සහ රණවිරු සේවා අධිකාරිය ඒකාබද්ධව සංවිධානය මෙම වැඩසටහනේ දී පැළ 25,930ක් එකම ප්‍රදේශයක සිටුවීම මෙහිදී සිදු කෙරිණි.

මෙම අවස්ථාවට වනජීවී හා වන සම්පත් රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතා සමග ප්‍රාදේශීය පානීය ජල සම්පාදන, ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා මහතා ඇතුළු ප්‍රදේශයේ දේශපාලනඥයෝ පිරිසක්ද, මියගිය රණවිරු පවුල්වල සාමාජික පිරිසක්ද, වනජීවී හා වන සම්පත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික මේජර් ජනරාල් පාලිත ප්‍රනාන්දු මහතා ඇතුළු එම නිලධාරීහු පිරිසක් ද, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කේ.ජී. විජේසිරි මහතා ඇතුළු ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදාවේ උසස් නිලධාරීන් හා සෙසු නිලයන්හි පොලිස් නිලධාරීහු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# අතරගල්ලේ මී ගවයන්ගෙන් අබකොළවැව ඇළවේලිවලට හානි

**(අඹන්පොළ ශෂිකලා දර්ශනී)**

**අතරගල්ල ගොවීන්ගේ මී ගව පට්ටිවලින් අබකොළවැව ජනපදයේ ඇළවේලිවලට මහත් විනාශයක් සිදුව ඇති බැව් අබකොළවැව ගොවීහු චෝදනා කරති.**

මේ සම්බන්ධයෙන් කරුණු අනාවරණය කරමින් අබකොළවැව අභය ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික සී.ඒ.එච්.එම්. ජයසුන්දර මහතා මෙසේ ද කීය.

"මේ ප්‍රශ්නය කාලයක් තිස්සේ කතාබහට ලක්වුණු කාරණයක්. අපි කන්න රැස්වීම්වල ගොවි සමිතිවලත් මේ ගැන නිතර කතා කර පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා. අතරගල්ල ගොවීන්ගේ මී ගවයින් තුන් හාරසියයක් දිනපතා අබකොළවැව කුඹුරු බිම්වලට මුදහරිනවා. උන්ගේ කුරවලට පෑගීමෙන් ඇළවේලිවලට විශාල හානියක් සිදුව තිබෙනවා. මේ නිසා ගොවීන්ට විශාල පාඩුවක් සිදු වෙලා තිබෙනවා. හැම කන්නයකම නියර බඳින්න, ඇළවේලි පිළිසකර කරන්න, බිම් සකස් කරන්න විශාල වියදමක් දරන්න අපිට සිදු වෙලා. අපේ කුඹුරුවලට මෙමම මී ගව පට්ටි මුද නොහරින ලෙස අපි නිරන්තරයෙන් ඉල්ලීම් කළත් අබකොළවැව ගොවීන් මේ ගැන තැකීමක් කරන්නේ නෑ. එපමණක් නෙමෙයි මේ යල් කන්නයේ ඉපනැල්ලේ මුං වගාවටත් ගවයින්ගේ හානි සිදු වුණා. ඇතැම් ගොවීන්ට තමන්ගේ මුං වගාවෙන් දෙවැනි මුරයේ අස්වනු නෙළා ගන්න හැකි වුණෙත් නෑ. අපේ ගොවීන් මේ නිදැල්ලේ යවන ගවයින් අල්ලා ගස් බැඳ පොලිසියට පවා අවස්ථා ගණනාවක දී පැමිණිලි කළා. නමුත් ප්‍රශ්නයට මෙතෙක් කිසිදු විසඳුමක් නෑ." යි ජයසුන්දර මහතා කියයි.


ගොවීන් වැවට පුද සත්කාර කරන්නේ මෙහෙමයි




ඉඟිනිමිටිය වැව පෝෂණය කරන කොටසිය අළඟ ගොඩ වී ඇති අයුරු

# වැව් තාවලු කොල්ලයෙන් නිර්මාණය වූ පාරිසරික ප්‍රශ්න


**ගොවියා ගේ පණ නල නිල් දියවරයි. පැරැන්නෝ වැවට දේවත්වයෙන් සැලකූහ. නමුත් අද එවැන්නක් නැත. වැව් පද්ධතිය මොහොතින් මොහොත පරිහානියට ලක් වෙමින් පවතින්නේ මිනිස්සුන්ගේම වරදිනි. හැම පැත්තකින්ම ඇසෙන්නේ වැව් ගොඩ වීම් ගැනය, වැවේ ජලය ප්‍රමාණවත් නැති බවය. මේවාට හේතු බොහෝ ඇති මුත් වැව් රක්ෂිත අල්ලා ගැනීම, වැව් තාවලුවල අනවසර ඉදිකිරීම් සහ අනවසර වගාවන් ආදී හේතු පෙළක් මේ වටා ගෙතී ඇත.**

මිනිසාගේ ස්වභාවය සෑහීමට පත් නොවීමය. තමන්ට වෙන් වුණු හතර මායිමෙන් තුටු පහටු නොවී වැව ද අල්ලා ගෙන වගා කරති. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රධාන වැව් බොහොමයක් අගාධයට යමින් ඇත්තේ වැව් පද්ධතියේ අංගපුලාවන් මිනිසා විසින්ම කෙලෙසීම නිසාය. මේ වනවිට බොහොමයක් වැව්වල තාවල්ල විශාල වගා බිම් බවට පත්ව ඇත. මේවා සියල්ල නීති විරෝධීය. නමුත් නැවතීමක් නැතැයි ගොවි ජනතාව පවසති. මේ හෙළිදරව්ව අනාගතය උදෙසා වැව් සම්පත රැක ගැනීම මිස අන් යමක් සඳහා නොවේ.

වැව් රක්ෂිත සහ වැව් ඉස්මත්ත අල්ලා ගෙන ඇත්තේ අවට පදිංචි වගා කරන ගොවීන්මය. නමුත්, ඇතැම් වගා බිම් මහා පරිමාණයෙන්ය. ඒවායේ අයිතිකරුවෝ පිටින් ආ සල්ලිකාරයෝ බව දන්නෝ කියති. එහි අල ගිය මුල ගිය තැන් සොයා ගැනීම අපහසුය.


උස්ගල සියඹලන්ගමුව ගොවි සංවිධානයේ සභාපති එස්.පී. තිලකරත්න


මහ සියඹලන්ගමුව වම් ඉවුර ගොවි සංවිධානයේ සභාපති ඩබ්.ටී. නිමල්


ඒකබද්ධ ගොවි සංවිධානයේ සභාපති එස්.ඩබ්.එම්. චන්ද්‍රසේන

**අපිට මුලින්ම කතා කළේ උස්ගල සියඹලන්ගමුව ගොවි සංවිධානයේ සභාපති එස්.පී. තිලකරත්න මහතායි.**

“1959-62 ප්‍රතිසංස්කරණ කටයුතුවලදී වැවේ ආරක්ෂාවට අදාළව වැව් රක්ෂිතය වෙන් කළා. නමුත් මහවැලි එච් කලාපයේ ගොවි පවුල් පදිංචි කිරීමේ දී ඔවුන්ට වැව් රක්ෂිතය ඉහළින් පිහිටි ඉඩම් නිරවුල් කර බෙදා දුන්නා. නමුත් මහවැලි ගොවීන් තමන්ගේ අක්කර දෙක හමාර ටිකෙන් ටික විශාල කරගෙන වැවේ රක්ෂිතයත් අල්ලාගෙන වගා කරන්න පටන් ගත්තා. අදටත් මේ කාර්යය එලෙසම සිද්ධ වෙනවා. අපි මේ ගැන කෘෂිකර්ම කමිටුවල, ව්‍යාපාර කමිටුවල, කන්න රැස්වීම්වල කතා කළත් කිසිදු විසඳුමක් ලැබිලා නෑ. වැවේ රක්ෂිත වල් අලින්ගේ නිජබිමක්. අද මේ බිම උන්ට නෑ. අලි ගම් වදිනවා. ඇතැම් පුද්ගලයින් අක්කර 5-6 අල්ලා ගෙන. අක්කර විසිපහක් තිහක් පමණ දැනටමත් වැවට අහිමි වෙලා. කඩිනමින් මේ රක්ෂිතය නිදහස් කර නොගත්තොත් ඉදිරියේ දී වැවට විශාල හානියක් වෙනවා.”

- ඇතැම් අය අනවසරයෙන් වැව් තාවල්ලේ අක්කර 5-6 අල්ලාගෙන
- වැව් තාවල්ල අල්ලගත්තම වල් අලි ගම් වදිනවා
- වැව් තාවල්ලේ හේන් වගාවට ගහන වල් නාශක වැවට සෝදාගෙන එනවා
- වැව්වලට එකතුවන කෘමිනාශක නිසා වැවේ මත්ස්‍ය සම්පත විනාශවෙනවා
- ඉඟිනිමිටිය වැව් තාවල්ලේ අක්කර 500 ක් බලවත්තු අල්ලගෙන
- වැවට එකතුවන කෘමිනාශක නිසා ගම් පිටින් වකුගඩු රෝගීන් වෙලා
- හක්වටුණා වැවේ අක්කර 150 කුත් බලහත්කාරයෙන් අල්ලාගෙන

මී ඔය ව්‍යාපාරයේ පාලුකඩවල වැව ප්‍රදේශයේ පරිසර පද්ධතියේ තීරණාත්මක අඩවියකි. මේ වනවිට හේන් වගාවේ නිරත වන ගොවීන් පාලුකඩවල වැව ද අල්ලා ගෙන බලවත් පරිසර විනාශයක් සිදු කරමින් සිටින බව අනාවරණය කළේ, **මී ඔය ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ලීලානන්ද වීරසිංහ මහතායි.**

“මේ ප්‍රශ්නය අද ඊයෙක එකක් නෙමෙයි. පැත්ත පළාතම අනවසර හේන් වගාවට යට වෙලා. දැන් ටිකෙන් ටික වැව් තාවල්ලත් ආක්‍රමණය කරලා. වැව් තාවල්ලත් සමග බැඳී ඇති නාකොළගනේ ස්වාභාවික වන පියසේ තමයි මේ පැත්තේ වල් අලි ගැවැසෙන්නේ. කැලෑ සහ වැව් තාවල්ල ආක්‍රමණය කිරීමත් සමග අද වල් අලි ගමට එනවා. වල් අලි ප්‍රශ්නය ඔඩු දුවලා තියෙන්නේ, වන සතුන් පරිහරණය කරන වැව් තාවල්ල වැව් රක්ෂිත මිනිස්සු අල්ලා ගැනීම නිසයි.”

අබකොළවැව ද අද අනවසර වගාකරුවන්ගේ ග්‍රහණයට ලක්ව ඇතැයි ගොවීහු පවසති. මේ වැව් ඇත්තේ මිනිසාගේම යහපතට මුත් වැවට අවැඩක් වන පරිදි ක්‍රියා කිරීම කන බත් පතේ පහරන්නාක් වැන්නකි. **අබකොළවැවේ පළහිලව්ව ගැන ඉරිදා වයඹට හෙළි කළේ අභය ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික සී.ඒ.එච්.එම්. ජයසුන්දර ගොවි මහතායි.**

“කොහොඹකල්ල, ගුරුගොඩ, නිකවලයාය පැත්තෙන් තමයි වැව අල්ලා ගෙන තියෙන්නේ. වතුර පොම්ප 25-30ක් දලා වැවෙන් වතුර ගහනවා. අපේ ගොවියෙක් ඇළකින් වතුර ටිකක් ගොඩ බෝංචිකට ගත්තත් නිලධාරීන් අයියද කරනවා. අපි එහෙම සිදු කියනවා. නමුත් ඊට වඩා බොහොම විනාශයක් වැව් තාවල්ලේ කෙරෙනවා. අක්කර 20-25ක් වගා කරලා. තාවල්ල කපනකොට පස හේදිලා වැවට එනවා. වැව ගොඩ වෙලා අල්ලන ජල ධාරිතාව දැන් පහළට වැටිලා. වැව් තාවල්ල අනවසර වගා බිම්වලින් නිදහස් වුණොත් අපිට වැව හා ටිකක් උස්සලා ජල ප්‍රමාණය වැඩි කරගන්න පුළුවන්.”

ඉඟිනිමිටිය යනු බරපතළ පාරිසරික ගැටලුවකට මුහුණ පා ඇති වැවකි. මෙය 1982-86 වැනි කාල භාගයේ නිර්මිත වැවක් වුව වයඹ වනජීවී කලාපයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැව් පද්ධතියේ කේන්ද්‍රස්ථානයකි. වයඹ වනජීවී කලාපයේ වල් අලින් සඳහා සුරක්ෂිත කලාපයකි. අද වැවට සිදුව ඇත්තේ කුමක් ද? මේ ගැන ඉරිදා වයඹට හෙළිදරව් කළේ, ඉඟිනිමිටිය රුදේවිබැඳි ඇළ ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති එස්.ඩබ්. එම්. චන්ද්‍රසේන මහතායි.

“අද ඉඟිනිමිටිය වැව් තාවල්ල මහා පරිමාණ සල්ලිකාරයන්ගේ බුදලයක්. අක්කර 500ක් පමණ අල්ලා ගෙන වැවේ වතුර බිඳෙන කාලයට වැව් පිටියට බැහැලා ට්‍රැක්ටර් දලා හාලා වගා කරනවා. කෙල් පොහොර ගහනවා. ටෙට්‍රොක්සා, කොමඩු තමයි වවන්නේ. වගා බිම්වල අයිතිකාරයෝ ලක්ෂපතියෝ. අපේ ගම්වල මිනිස්සු කුලියට වැඩ කරනවා. ඉඟිනිමිටිය වාරිමාර්ග මහත්වරු නිතරම ගිහින් වට්ලනවා. අල්ලපොතේ අහු වෙන්නේ කුලියට වැඩ කරන මිනිස්සු. විදුලි වැටවල් ගහගෙන තුවක්කු තියාගෙන තමා බිම් රකිනවා. වන සතෙකුට වතුර පොදක් බොන්න වැවට බහින්න බෑ. අද වැව් තාවල්ලේ කෙතන පස සෝදාගෙන ඇවිත් වැව සම්පූර්ණයෙන් ගොඩ වෙලා.”

**මැනුම් නියෝග ක්‍රියාත්මක කර රක්ෂිත අල්ලාගන්න අයට දඬුවම් කරනවා**


**ගල්ගමුව වාරිමාර්ග ඉංජිනේරු චමින්ද පුෂ්පකුමාර**


අනවසර වගා බිම් නිසා සිදුව ඇති විපත ඉඟිනිමිටිය ජලාශයට පමණක් නොව ජන ජීවිතයට තීරණාත්මක බලපෑමක් සිදු කර ඇති බව චන්ද්‍රසේන මහතා වැඩිදුරටත් පැවසුවේ මේ අන්දමිනි.


“වගාවට ඉසින කෙල් පොහොර ඔක්කොම වැවට හේදිලා එනවා. වැවට අමතරව ඉඟිනිමිටිය ජනතාව පරිභෝජනය කරන ප්‍රජා ජල මූලාශ්‍රයවලට ජලය ගන්නේ වැවෙන්. අද වකුගඩු රෝගය බහුල වෙලා. අපි මේ ගැටලුව කන්න රැස්වීම්වල, කෘෂිකර්ම කමිටුවල කතා කරනවා. නමුත් නිලධාරීන්ටත් මේ බරපතළ විනාශය නවත්වන්න ලෙහෙසි පහසු නෑ.”

මහ සියඹලන්ගමුව වයඹ වනජීවී කලාපයේ වල් අලින්ට නිජබිමක් වන මහ සියඹලන්ගමුව වැව් රක්ෂිතය වැවේ සුරක්ෂිත බව තහවුරු කරන පවුරු වළල්ලක් බඳුය. 2012 වසරේ වැව් රක්ෂිතය ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රදේශවාසීන් රාජ්‍ය ආයතන කිහිපයක සහාය ඇතිව විශේෂ පාරිසරික වැඩසටහනක් ද ක්‍රියාතමක කළමුත්, අද වනවිට ඒ සියල්ල පුස්සක් බවට පත්ව ඇති බව පැවැසුවේ, **මහ සියඹලන්ගමුව වම් ඉවුර ගොවි සංවිධානයේ සභාපති ඩබ්.ටී. නිමල් මහතායි.**

“වැව ආරක්ෂා කරගැනීමට 2012 දී වැවේ මායිම් නිරවුල් කරලා ගල් දැම්මා. ඒවා අනවසර වගාකරුවෝ ගැලෙව්වා. 2018 දී පැළ 15,000ක් රක්ෂිතයේ හිටෙව්වා. අද එක පැළයක්වත් නෑ. සියල්ලම ගලවලා. අපි දන්නා තරමින් අක්කර 200ක් පමණ වැව් රක්ෂිතයෙන් අල්ලා ගෙන වගා කරනවා. වැව ඇතුළේ විදුලි වැටවල් ගහලා. නියරවල් බැඳලා කුඹුරු කරනවා. මේ නිසා වැව් රක්ෂිතයේ ඉන්න වල් අලි ගම්මානවලට වැදිලා මහත් විනාශයක් කරනවා. විසඳුමක් පේන තෙක් මානයකවත් නෑ. මේ ප්‍රශ්නය විසඳන්න කාටවත් වුවමනාවකුත් නෑ. වැවේ බැම්ම අයිති පොල්පිතිගමට. වැවේ වතුර පලාගලට.”


අභය ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික සී.ඒ.එච්.එම්. ජයසුන්දර


මී ඔය ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ලීලානන්ද වීරසිංහ


හක්වටුණාව ගොවි සංවිධානයේ සභාපති විජේසූරිය ඒකනායක

හක්වටුණාව ජලාශය බොහොම උණුසුම් පුවත් මවන ලද්දේ, කාලයක් තිස්සේ ජලාශයට අයත් බිමෙන් කොටසක් ඉරුදෙණියාව ප්‍රදේශයෙන් පිරිසක් අල්ලා ගෙන වැට මායිම් ද ගසා ගැනීමත් සමඟය. **හක්වටුණාව ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති විජේසූරිය ඒකනායක මහතා මේ ගැන වැඩි විස්තර කියා සිටියේ මෙලෙසිනි.**

“අක්කර 150ක් විතර වැවෙන් අල්ලා ගෙන. වැවට අයිති කොටසේ පාසල් පවා තිබෙනවා. එයින් වැවට බොහොම හානියක්. වැව සම්පූර්ණයෙන්ම ගොඩ වෙලා. වතුර මැෂින් දලා වැවේ වතුර ගන්නවා. මේ ප්‍රශ්නය විසඳන්න බැරි වගකිව යුතු ආයතන ඒකමතික තීරණයක පිහිටලා අවශ්‍ය කටයුතු නොකරන නිසයි.”

අහසින් වැටෙන් හැම දිය බිඳක්ම ප්‍රයෝජනයට ගන්නැයි පරාක්‍රමබාහු නිරිඳුනත් සිංහලයාට කී මුත්, වතුර අල්ලන හැම බිම් අඟලක්ම වගා කරපල්ලා යැයි කීවේ නැත. කයෝර හේන් මූකලාන් කපා අපේ පැරැන්නෝ තල ඇටයක්, මුං ඇටයක් ගෙට ගත්තේ වතුර අල්ලක් නැති මහ නිකිනි කාලයන් ද තඹයකට මායිම් නොකරය. නමුත් ඒ ඇත්තන්ගේ වත්මන් දූ පුත්තු ලෙහෙසි පහසුවට වැව් පිටිය කම්බස් කරමින් ඇට හිටවා මලු පුරවා ගැනීම නිහීන ක්‍රියාවකි. ගොවීන් පවසන්නේ, මේ අපූරු ගොවිතැන අද ඊයෙක නොව වසර දහයක පමණ සිට ගජරාමෙට සිදු වෙමින් එන බවකි. එතෙක් කලක් වගකිව ඇත්තෝ කුමක් කළේ ද? අපි ගොවීන්ගේ මේ දුක් ගැනවිල්ල බලයලත් ඇත්තන්ට යොමු කළෙමු.

**ගල්ගමුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ගයාන් වීරසූරිය මහතා ඒ ගැන මෙසේ කියා සිටියේය.**

“ඕක කාලයක සිට එන ගැටලුවක්. වැව් රක්ෂිතයේ වගා කරන අයට විරුද්ධව අපි නඩු දැම්මත් ඔවුන් නැවතත් ඊළඟ කන්නයේ වගා කරනවා. අපි නිතර වැටළීම් කරනවා. තරයේ අවවාද කරනවා. නමුත් ඇතැම් පිරිස් ටික කාලයක් වගා කටයුතු නොකර ඉඳලා නැවත කරනවා. මේ නිසා ස්ථිර විසඳුමක් ලබා දීමට මැනුම් නියෝගයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඊට අනුමැතිය ලැබුණු වහාම රක්ෂිත මැනුම් කර සීමා ලකුණු කරනවා. ඉන් පසු වැව් රක්ෂිතය අල්ලන සියලු දෙනාට අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා.”

**ඉඟිනිමිටිය ජලාශයේ ඉරණම සහ විසඳුම් පිළිබඳව කරුණු දැක්වූයේ, ඉඟිනිමිටිය වාරිමාර්ග ඉංජිනේරු චමින්ද පුෂ්පකුමාර මහතායි.**

“මම ඉඟිනිමිටයේ වැඩ භාර ගත්තේ 2018 දී. එදා සිට මේ දක්වා අවස්ථා ගණනාවකදීම අනවසර වගාකරුවෝ ගෙනැත් දැනුම්වත් කිරීම් කළා. මහා පරිමාණ වගා කරන්නේ වැවේ ගල්ගමුව කොට්ඨාසයට අයත් කොටසේ. මේ ප්‍රශ්නය විසඳීමට නම් එකම ක්‍රමවේදය අධිකරණ ක්‍රියාමාර්ගයකින් දඬුවම් ලබා දීමයි. නමුත් ඒ සඳහා අපිට තියෙන බාධාව වැවේ රක්ෂිත සීමාව භූමියේ පිහිටුවා නැති එකයි. නමුත් අපිට බැලූ බැල්මටම වැව ආක්‍රමණය කර ඇති බව ප්‍රත්‍යක්ෂයි. නමුත් නඩු මගට යන්න නම් සීමා හඳුනාගත යුතුයි. අපි ඒ සඳහා 2018 මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මැනුම් ඉල්ලීමක් යොමු කළා. එමෙන්ම ඇස්තමේන්තුවට අනුව අපි ඒ සඳහා රුපියල් 15,60,000ක් මුදලින් බැන්ද. 2019 දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව මැනුම පටන් ගත්තත් එය අතරමඟ නැවතුණා. මැනුම් කටයුතු අවසන් නොවන තුරු වැවට අයිති කොටස අත්පත් කරගැනීමට හැකියාවක් නෑ.”

**ගල්ගමුව අඩවි ආරක්ෂක නිමල් රත්නායක මහතා පැවසුවේ මෙවැන්නකි.**

“වැව් රක්ෂිත තාවලු අල්ලා ගැනීමෙන් මතුව ඇති බරපතළම ප්‍රශ්නය අලි ගම් වැදීමයි. නමුත් මේ ප්‍රශ්නයට අපිට අත ගහන්න බෑ. ගල්ගමුව වනජීවී කාර්යාලයට එකම බිම් අඟලක්වත් නෑ. අපිට ගැසට් පත්‍රයකින් මේ භූමියේ අයිතිය අපිට දෙනවා නම් අපි අනවසර වගා සියල්ල නවත්වනවා. ඉඟිනිමිටිය රක්ෂිතය ගැසට් කරලා අපිට දෙන්ඩ කීවා. නමුත් වුණේ නෑ. අපිට දැනට කරන්න තියෙන්නේ ප්‍රශ්නයේ ස්වභාවය සෙසු ආයතනවලට දන්වා යවා විසඳුමක් ලබා දෙන ලෙස දැනුම් දීම පමණයි. මිනිස්සු අලි ගමට ආවාම බනින්නේ අපිට.”

වැවේ නිල් දියවර මිස නිල්ල පිරුණු වගා බිම් එලක් නැත. වසවිස නහවන වගා බිම් වැව තුළ වෙත් නම් එම පරිසර පද්ධතියට කුමක් වේද? **අප පැනයට පිළිතුරු දුන්නේ කුරුණෑගල දිස්ත්‍රික් ජල ජීවී වගා ව්‍යාප්ති නිලධාරි එස්.ඩී.ටී. සිසිත කුමාර මහතායි.**

“වගා බිම්වලට යොදන කෘමිනාශක සහ පොහොර වැව් ජලයට එක්වීමෙන් ඇල්ගී වර්ධනය වැඩිවෙනවා. මසුන්ගේ වර්ධන අවස්ථාවට ලොකු බලපෑමක් නොවුණත් අභිජනනයට සහ බිත්තරවලට මේ වස විස හානිකරයි. මින් මත්ස්‍ය සම්පත වඳ වෙනවා. බොහොමයක් මසුන් බිත්තර දමන්නේ ගොඩබිම ආසන්නයේ වැව් ජලයේ. මෙම අනවසර වගා බිම් වැව් පරිසර පද්ධතියට බරපතළ විනාශයක් ඇති කරමින් තිබෙන බව අපිත් පෙන්වා දෙනවා.”

බොහොමයක් වැව්වල ඉතිහාසය රජ කාලයට දිව ගියද පසුකාලීනව ඉදිකළ වැව් ද වැවේ ආරක්ෂාව සහ පැවැත්ම තහවුරු වන ආකාරයට ඉදි කර ඇත. වැව් තාවුල්ල සහ රක්ෂිතය වැවේ හදවත බඳුය. මෙය සශ්‍රීක කලාපයක් ලෙස නිර්මාණය වී ඇත්තේ පාරිසරික සමතුලිතාව ආරක්ෂා වීමටය. නමුත් මිනිස්සු තම බඩ කට පුරවා ගැනීමට මේ බිම් ද ඩැහැ ගැනීමට උත්සාහ දරන්නේ නම් එහි බරපතළ ප්‍රතිවිපාක වැඩි ඈතක නොවනු ඇත.




පාලුකඩවල වැව ඉස්මත්ත ආසන්නයේ වල් අලි රැඳෙන මහ මූකලාන් එළි කර ඇති අයුරු


උස්ගල සියඹලන්ගමුව වැව් ඉස්මත්තේ වගා කර ඇති අයුරු

සටහන සහ ඡායාරූප
අඹන්පොළ **ශෂිකලා දර්ශනී**

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 14 වැනිදා ඉරිදා එම ස්ථානයේ මුද්‍රණය කරන ලදී